*සැ. යු.*- 2019.04.12 දින පළ වූ අංක 2,119 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,120 - 2019 අප්‍රේල් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2019.04.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 290 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 මැයි මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අප්‍රේල් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය)

නඩු අංකය : එච්.සී. (සිවිල්)/12/19/CO.
ස්වභාවය : ඈවර කිරීම
වටිනාකම : රු. 29,059,297.36
පටිපාටිය : ලඝු

කුණ්ඩසාලේ, පල්ලෙකැලේ, විලා සැන්ඩිල්වුඩ්, අංක 09 සහ බත්තරමුල්ල, දෙනියවත්ත පාර, අංක 476/1 හි මානුක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් වූ ඉල්ලීමකි.

*සහ*

2007 අංක 7 දරන සමාගම පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වූ ඉල්ලීමකි.

එල්. ඕ.එල්. සී. ෆැක්ටර්ස් ලිමිටඩ්,
ලියාපදිංචි කාර්යාලය, අංක 100/1,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

*ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය :*

අංක 504, නාවල පාර, රාජගිරිය.

*..................................පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් වාණිජ මහාධිකරණය විසින් ණයන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් රාජගිරිය, නාවල පාර, අංක 504 යන ලිපිනයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 100/1 යන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි එල්. ඕ. එල්. සී. ෆැක්ටර්ස් ලිමිටඩ් සමාගම විසින් වර්ෂ 2019ක් වූ පෙබරවාරි මස 26 වැනි දින වාණිජ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2019ක් වූ මැයි මස 10 වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණ බවත්, එම පෙත්සමට අදාල නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැළකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණයහිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමාම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කළේ :* ශ්‍රීමාල් පොන්නම්පෙරුම
අංක 22, ෂේඩ් ග්‍රෝව් ඇවිනියු,
කොළඹ 08.

***සටහන.***- එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් ශ්‍රීමාල් පොන්නම්පෙරුම වෙත ගෙනැවිත් භාරදිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2019ක් වූ මැයි මස 09 වැනි දින පස්වරු 6.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාර දිය යුතු ය. *නැතහොත්* එපරිදි තැපෑලෙන් එවිය යුතු ය.

ශ්‍රීමාල් පොන්නම්පෙරුම
අංක 22, ෂේඩ් ග්‍රෝව් ඇවිනියු,
කොළඹ 08.

04-702

**කොළඹ දී පවත්වනු ලබන සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය**

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී,

*පෙර*

එම් සී එස් එල් ෆිනෑන්සියල් සර්විසස් ලිමිටඩ් සහ මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්,
බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

........................*පැමිණිලිකරු.*

නඩු අංකය : CHC/619/09/MR

*එදිරිව*

හේවාකෝන් ඉන්ද්‍රානි පෙරේරා,
අංක 474/F,
කඹුරුගල්ල වත්ත, රුක්ගහවිල.

...........................*විත්තිකාරිය.*

ඉහත නම් සඳහන් විත්තිකාරිය වෙතය.

මෙම නඩුවෙහි වර්ෂ 2018ක් වූ පෙබරවාරි මස 05 වන දින ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි මෙම නඩුවේ විත්තිකාරියට විරුද්ධව,

*(අ)* ඉහත කී නඩු නිමිත්ත මත කෙටි කාලීන ණය අංක KUCRTL0800198100 යටතේ 2009.07.14 දිනට රු. 4,976,250.23ක මුදලක් සහ 2009.07.15 දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් මසකට 4% බැගින් පොලිය ද සමග අයකර ගැනීම සඳහා පැමිණිලිකරු හිමිකම් ලබන බවට මෙයින් අණ කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

*(ආ)* මෙහි වූ උපලේඛනයෙහි විස්තර කොට ඇති මුළු ඉඩම් කැබලි (මෙහි මින්මතු ''උකස් කරන ලද දේපළ'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ මත පිහිටි ගොඩනැගිලි හා ව්‍යුහයන් ද, එකී උකස් කරන ලද දේපළ විෂයෙහි එයින් එයට හෝ ඒ මත සියලු ඉඩකඩම්, අයිතිවාසිකම්, හිමිකම්, දේපළ සම්බන්ධතා, හිමිකම්පෑම් හා ඉල්ලීම් ද සමග කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එඩ්මන්ඩ් කුලරත්න මහතා විසින් ලියා සහතික කරන ලද අංක 12607 හා වර්ෂ 2008.06.26 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාර ඉහත කී මුදල් අයකර ගැනීම පිණිස බැඳී ඇති බවට හා ක්‍රියාවෙහි යෙදවිය හැකි බවට සහ ඉහත කී මුදල් අයකර ගැනීම අරබයා එකී උකස් බැඳුම්කරය ක්‍රියාවෙහි යෙදවීමට පැමිණිලිකරු හිමිකම් ලබන බව ප්‍රකාශ කර ඇති හෙයින් ද,

එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව, විත්තිකාරිය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ වර්ෂ 2019ක් වූ මැයි මස 14 වැනි දින ප. ව. 2.00ට,

එකී දේපළ පිහිටා ඇති පානදුර, තෙලිපිටිය, වරිපනම් අංක 312/10 දරන ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ, පානදුර, තල්පිටිදෙබැද්දේ (වාද්දුව උප කාර්යාලයේ) පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ තෙලිපිටිය ගමේ ගාලු පාරේ වරිපනම් අංක 312/10, ''කිරිපැල්ල ගහවත්ත, හීන්කතවැල, ඕවිට ඉරවැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ඕ. සිල්වා මහතා විසින් මැන සාදන ලද අංක 10875 සහ 1993.10.20 දින දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 3ට මායිම්, *උතුරට* : පෙරේරා යන අයට අයත් ඉඩම ද, *නැගෙනහිරට* : 1978.08.08 දින දරන අංක 426 දරන පිඹුරේ කැබලි අංක 04 ද, *දකුණට* : අඩි 16 පළල පාරක් සඳහා වෙන් කරන ලද කැබලි අංක 22 සහ *බටහිරට* : 1978.08.08 දින දරන අංක 426 දරන පිඹුරේ කැබලි අංක 02 යන මායිම් තුළ පිහිටි පර්චස් විසි එකයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 21.50) සහ හෙක්ටයාර් (0.0544) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ආදී සියලු දේ ද සමඟ වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 307/171 සහ F 570/111 දරන පත් ඉරුවල ලියාපදිංචි වී ඇත.

ඉහත කී පිඹුරු අංක 10875 හි කැබලි අංක 03 පහත ඉඩමෙන් බෙදා වෙන් කරන ලද්දකි.

*පාරක් සඳහා වෙන් කරන ලද පහත සඳහන් ඉඩම් කැබැල්ල ද සමඟ වේ :*

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ, පානදුර, තල්පිටිදෙබැද්දේ (වාද්දුව උප කාර්යාලයේ) පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ තෙලිපිටිය ගමේ ''කිරිපැල්ල ගහවත්ත, හීන්කතවැල, ඕවිට ඉරවැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. එම්. පී. බී. කරුණාසුන්දර මහතා විසින් මැන සාදන ලද අංක 426 සහ 1978.08.08 දින දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 22ට මායිම්, *උතුරට* : මෙම ඉඩමේ කැබලි අංක 12, 3, 4, 5 සහ 7 ද, *නැගෙනහිරට* : කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගය ද, *දකුණට* : මෙම ඉඩමේ කැබලි අංක 8, 9, 10, 11, 12 සහ 13 සහ *බටහිරට* : මෙම ඉඩමේ කැබලි අංක 01 යන මායිම් තුළ පිහිටි පර්චස් විසි දෙකයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 22.7) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ආදී සියලු දේ ද සමඟ වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 266/85 සහ F 370/292 දරන පත් ඉරුවල ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම.-* කොළඹ කොටුවේ සිට ගාලු පාර ඔස්සේ පානදුර නගරය පසු කර කි. මී. 31 වැනි කනුව දක්වා ගමන් කර එතැන් සිට ගාල්ල දෙසට තවත් මී. 75ක් පමණ ගමන්කර දකුණට පිහිටා ඇති අඩි 16ක් පළලැති කොන්ක්‍රීට් දමා නිමකර ඇති පාරේ මී. 150ක් පමණ ගමන් කිරීමෙන් පාරේ දකුණුපසින් පිහිටි ගාලු පාරේ වරිපනම් අංක 312 දරන නිවසේ සිට පිහිටා ඇති 3 වැනි නිවස වේ.

බී. ජේ. ගිලානි ද සිල්වා,
අධිකරණ රෙජිස්ට්‍රාර්,
නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2019ක් වූ අප්‍රේල් මස 05 වැනි දින දී ය.

04-825

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.